මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
முஸ்லிம் சமய பண்பாட்டலுவல்கள் திணைக்களம்
DEPARTMENT OF MUSLIM RELIGIOUS AND CULTURAL AFFAIRS
තැපැල් පෙට්ටිය 543, අංක 180, ටී.බී. ජයා මාවත, කොළඹ 10.
தபால் பெட்டி 543, இல. 180, ரீ.பி. ஜாயா மாவத்தை, கொழும்பு 10.
P.O. Box 543, No. 180, T.B. Jayah Mawatha, Colombo 10.
E-mail : director@muslimaffairs.gov.lk
Web : www.muslimaffairs.gov.lk

මගේ අංකය / எனது இல. / My No } DMRCA/H/GEN/2026 ඔබේ අංකය / உமது இல. / Your No } දිනය / திகதி / Date } 16-06-2026

**අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු**

**<u>හජ් වන්දනාකරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ නිවේදනය - හජ් 2027</u>**

2027 වර්ෂයේ හජ් වන්දනාව ඉටු කිරීමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකික මුස්ලිම් බැතිමතුන් සඳහා ලියාපදිංචි කිරීම සම්පූර්ණයෙන්ම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ ආරම්භ කර ඇති බව සතුටින් දන්වමු.

02. ඒ අනුව, 2027 වර්ෂයේ හජ් වන්දනාව සඳහා අයදුම් කරන සියලුම බැතිමතුන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

- ශ්‍රී ලාංකික මුස්ලිම් වරයෙක වීම
- 2027.03.09 දිනට (වීසා නිකුත් කිරීමේ අවසාන දිනය) වයස අවුරුදු 15 හෝ ඊට වැඩි වීම
- 2026 වර්ෂයේ හජ් වන්දනාව ඉටු කර නොතිබීම

03. අයදුම්කරුවන්, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (DMRCA) වෙබ් අඩවිය (website) හෝ QR කේතය භාවිත කරමින්, වලංගු ජාතික හැඳුනුම්පත් අංකයක් (NIC) සහ ජංගම දුරකථන අංකයක් ලබාදී ලියාපදිංචි විය යුතුය. එකම අයදුම්පත්‍රයක් යටතේ පවුලේ සාමාජිකයන් ද ලියාපදිංචි කළ හැකිය. තවද වයස අවුරුදු 15 සම්පූර්ණ කර ඇති නමුත් ජාතික හැඳුනුම්පත් අංකයක් නොමැති දරුවන් සඳහා, ඔවුන්ගේ උපන්දිනය සඳහන් ඇතුලත් කරමින් ලියාපදිංචි විය හැකිය.

04. 2027 හජ් වන්දනාවට අදාළ සියලු නිවේදන, උපදෙස් සහ යාවත්කාලීන තොරතුරු ලියාපදිංචි කිරීමේදී ලබාදෙන ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩ (SMS) මගින් දැනුම් දෙනු ලබන බැවින්, අයදුම්කරුවන් තමන්ගේම පුද්ගලික ජංගම දුරකථන අංකය ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

05. හජ් නියෝජිතයන්, උප නියෝජිතයන් හෝ අතරමැදියන් මාර්ගයෙන් ලියාපදිංචි වීමෙන් වැළකී සිටින ලෙසත්, නිල පද්ධතිය හරහා තමන් විසින්ම ලියාපදිංචි වන ලෙසත් බැතිමතුන්ට දැඩිව උපදෙස් දෙනු ලැබේ.

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
முஸ்லிம் சமய பண்பாட்டலுவல்கள் திணைக்களம்
DEPARTMENT OF MUSLIM RELIGIOUS AND CULTURAL AFFAIRS
තැපැල් පෙට්ටිය 543, අංක 180, ටී.බී. ජයා මාවත, කොළඹ 10.
தபால் பெட்டி 543, இல. 180, ரி.பி. ஜாயா மாவத்தை, கொழும்பு 10.
P.O. Box 543, No. 180, T.B. Jayah Mawatha, Colombo 10.
E-mail : director@muslimaffairs.gov.lk
Web : www.muslimaffairs.gov.lk

06. තවද, 2026 වර්ෂයේ හජ් ලියාපදිංචි කිරීමේදී රු. 5,000/- ක ලියාපදිංචි ගාස්තුව ගෙවා තිබූ නමුත් හජ් වන්දනාව සඳහා සහභාගී වීමට නොහැකි වූ බැතිමතුන්, නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් නැවත ලියාපදිංචි විය යුතුය. එහෙත් එවැනි අයදුම්කරුවන්ට නැවත ලියාපදිංචි ගාස්තුවක් ගෙවීමට අවශ්‍ය නොවන අතර, පසුගිය වසරේ ලැබුණු ලියාපදිංචි අංකයම නැවත ලියාපදිංචි අංකය ලෙස ලබාදෙනු ඇත

07. වැඩිදුර විමසීම් සඳහා හජ් අංශය අමතන්න : **011 266 7901 / 011 266 7909**

සර්වබලධාරී අල්ලාහ් දෙවියන් වහන්සේ අප සැමට හජ් වන්දනාව ඉටු කිරීමට අවස්ථාවත් භාග්‍යයත් ලබාදෙත්වා! **ආමීන්.**

**අධ්‍යක්ෂ**
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**සභාපති**
හජ් හා උම්රා කමිටුව

**සටහන:** පහත සඳහන් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හෝ ලබාදී ඇති QR කේතය ස්කෑන් කිරීම මගින් ලියාපදිංචි විය හැකිය.

**Facebook:** Department of Muslim Religious and Cultural Affairs

**Website**: muslimaffairs.gov.lk → Hajj Registration

QR code

කාර්යාලය-පොදු / அலுவலகம்-பொது / Office General – 0112667909
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director – 0112669965
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ / பிரதி/உதவிப் பணிப்பாளர் / Deputy/Assis.Director – 0112669979 (Wakf/Haj, 0112669989( Ad/Reli), 0112669986 (Wakf)
ෆැක්ස් අංකය / தொலைநகல் இல. / Fax No – 0112692147